# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2114/11 - 2019 මාර්තු මස 12 වැනි අඟහරුවාදා - 2019.03.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත**

9 වගන්තිය යටතේ කරනු ලබන නිශ්චය

2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 9(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ඩබ්. එම්. එම්. බී. වීරසේකර වන මා විසින් මෙම නිවේදනයේ උපලේඛනයේ II වැනි තීරුවේ නිශ්චිතව සඳහන් බද්ද එම උපලේඛනයේ I තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් ප්‍රදේශ තුළ සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි කිසියම් කුඹුරු ප්‍රමාණයක් සඳහා එක් එක් කන්නය වෙනුවෙන් අඳ ගොවියා විසින් ඉඩම් හිමියා වෙත ගෙවිය යුතු බද්ද බව නිශ්චය කරනු ලැබේ.

02. 2018.08.30 දින හා අංක 2086/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 9 වගන්තිය යටතේ වූ නිවේදනය මින් පරිච්ඡින්න කරනු ලැබේ.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 08 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
තැ. පෙ. 537,
කොළඹ 07.

**උපලේඛනය**

| | *I වන තීරුව* *ප්‍රදේශය* | *II වන තීරුව* *වගා කළ එක් අක්කරයක් වෙනුවෙන් බද්ද* | | |
|---|---|---|---|---|
| | | *මහා වාරිමාර්ග ක්‍රම යටතේ පෝෂිත* *බුසල්* | *සුළු වාරිමාර්ග ක්‍රම යටතේ පෝෂිත* *බුසල්* | *අහස් දියෙන් පෝෂිත* *බුසල්* |
| 01. | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කය | 10 | 10 | 10 |
| 02. | බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කය | 10 | 10 | 10 |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

| I වන තීරුව<br>ප්‍රදේශය | | II වන තීරුව<br>වගා කළ එක් අක්කරයක් වෙනුවෙන් බද්ද<br>මහා වාරිමාර්ග ක්‍රම යටතේ පෝෂිත බුසල් | සුළු වාරිමාර්ග ක්‍රම යටතේ පෝෂිත බුසල් | අහස් දියෙන් පෝෂිත බුසල් |
|---|---|---|---|---|
| 03. | මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කය | 15 | 14 | 13 |
| 04. | මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කය | | | |
| | (අ) මාතලේ, රත්තොට, උකුවෙල, අඹගන්ගඟ කෝරළය, යටවත්ත, ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 12 | 12 | 12 |
| | (ආ) නාඋල, පල්ලෙපොල, දඹුල්ල, විල්ගමුව, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 15 | 15 | 15 |
| 05. | මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කය | | | |
| | (අ) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 12 | 12 | 12 |
| | (ආ) අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 10 | 10 | 10 |
| 06. | දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කය | | | |
| | (අ) හිනිදුම්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 10 | 10 | 10 |
| | (ආ) අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 10 | 10 | 10 |
| 07. | දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කය | | | |
| | (අ) කඹුරුපිටිය, තිහගොඩ, හක්මන, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 12 | 12 | 12 |
| | (ආ) පිටබැද්දර, කොටපොල, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 10 | 10 | 10 |
| | (ඇ) අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 10 | 10 | 10 |
| 08. | දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කය | 14 | 12 | 10 |
| 09. | උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කය | 15 | 12 | 10 |
| 10. | උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කය | 10 | 10 | 10 |
| 11. | උතුරු පළාතේ වවුනියාව දිස්ත්‍රික්කය | 10 | 10 | 10 |
| 12. | නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කය | 12 | 10 | 10 |
| 13. | නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කය | | | |
| | (අ) පදියතලාව හා මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 12 | 10 | 10 |
| | (ආ) අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 12 | 10 | 10 |
| 14. | නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | 10 | 10 | 10 |
| 15. | වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය | 14 | 12 | 12 |
| 16. | වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය | 12 | 10 | 10 |
| 17. | උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය | 12 | 10 | 10 |
| 18. | උතුරුමැද පළාතේ පොලොන්නරුව දිස්ත්‍රික්කය | | | |
| | (අ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එගොඩපත්තුව | 10 | 10 | 10 |
| | (ආ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එගොඩපත්තුව හැර අන් සියළුම ප්‍රදේශ | 15 | 12 | 10 |
| 19. | ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කය | 15 | 15 | 12 |
| 20. | ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කය | 10 | 10 | 10 |
| 21. | සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කය | 12 | 10 | 10 |
| 22. | සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කය | 12 | 12 | 10 |
| 23. | බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය | 12 | 12 | 10 |
| 24. | උතුරු පළාතේ මුලතිව් දිස්ත්‍රික්කය | 10 | 10 | 10 |
| 25. | උතුරු පළාතේ කිලිනොච්චි දිස්ත්‍රික්කය | 15 | 12 | 10 |

**2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත**

35(1) වගන්තිය යටතේ කරනු ලබන නිශ්චය

2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 35(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ඩබ්. එම්. එම්. බී. වීරසේකර වන මා විසින් එකී පනතේ කුඹුරු ඉඩම්වල වී හැර වෙනත් යම් කෘෂිකාර්මික භෝග වගා කරනු ලැබ ඇති අවස්ථාවක මේ නිවේදනයේ උපලේඛනයේ II වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති බද්ද එම උපලේඛනයේ I වැනි තීරුවේ අනුරූප සටහනෙහි දක්වා ඇති කෘෂිකාර්මික භෝග, කිසියම් කුඹුරු ප්‍රමාණයක එක් එක් කන්නයකදී වගා කළ එක් අක්කරයක් සඳහා ගොවියා විසින් ඉඩම් හිමියා වෙත ගෙවිය යුතු බද්ද බව නිශ්චය කරනු ලැබේ.

02. 2018.08.30 දින හා අංක 2086/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 35(1) වගන්තිය යටතේ වූ නිවේදනය මින් පරිච්ඡින්න කරනු ලැබේ.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 08 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
තැ. පෙ. 537,
කොළඹ 07.

**උපලේඛනය**

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | |
|---|---|---|---|
| | | *වාරිමාර්ග ක්‍රමයක් යටතේ පෝෂිත වන (එක් අක්කරයක් සඳහා)* | *වාරිමාර්ග ක්‍රමයක් යටතේ පෝෂිත නොවන (එක් අක්කරයක් සඳහා)* |
| | | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | මිරිස් | 10,000 00 | 8,500 00 |
| 02. | රතුළූණු | 8,000 00 | 6,000 00 |
| 03. | ලොකු ළූණු | 8,000 00 | 6,000 00 |
| 04. | අර්තාපල් | 10,000 00 | 7,500 00 |
| 05. | සාම්ප්‍රදායික ලෙස උඩරට එළවළු වශයෙන් හඳුන්වනු ලබන එළවළු සඳහා (උදහරණ : ගෝවා, ලීක්ස්, බීට්රූට්, නෝකෝල් ආදිය) | 6,000 00 | 5,000 00 |
| 06. | සාම්ප්‍රදායික ලෙස පහතරට එළවළු වශයෙන් හඳුන්වනු ලබන එළවළු සඳහා (උදහරණ : පතෝල, වැටකොළු, පිපිඤ්ඤා, වට්ටක්කා, කැකිරි ආදිය) | 4,000 00 | 2,500 00 |
| 07. | සෝයා | 2,000 00 | 1,800 00 |
| 08. | කව්පි | 2,000 00 | 1,800 00 |
| 09. | මුං | 2,500 00 | 2,000 00 |
| 10. | උඳු | 2,000 00 | 1,500 00 |
| 11. | තල | 2,000 00 | 1,500 00 |
| 12. | බඩඉරිඟු | 2,000 00 | 1,500 00 |

03 - 1269/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.